**ඩෙල්ෆ්ට් ප්‍රාදේශීය සභාව**
**යාපනය දිස්ත්‍රික්කය**
**-----------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**-----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**-------------------------------**

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2016 මාර්තු 31 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව 2016 සැප්තැම්බර් 27 දින සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කරන ලදී.

### 1.2 තත්ත්වාගණණය කළ මතය
**----------------------------**

මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් ඩෙල්ෆ්ට් ප්‍රාදේශීය සභාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගණකාධිකරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිමු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
**-------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ දෝෂ
**-------------------**

(අ) රු.716,345 ක් වූ, විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත ගෙවිය යුතු විශ්‍රාම දායක මුදල පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. එම හේතුවෙන් සමුච්චිත අරමුදල වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) රු.3,835,000 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි වත්කම් පහත වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. එම හේතුවෙන් ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) රු.591,390 ක් වූ මුද්දර ගාස්තු මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. එම හේතුවෙන් ආදායම් ගිණුම් අඩුවෙන් දක්වා තිබුණි.

#### 1.3.2 ලැබිය යුතු මුදල්
**----------------**

රු.156,215 ක් වූ අත්තිකාරම් නිරවුල් කර ගැනීම සඳහා මුදල් වර්ෂය අවසානයේදී කටයුතු කර නොතිබුණි.

#### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම
**---------------------------------**

විගණනය සඳහා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් රු.716,345 සඳහා වූ ගනුදෙනු විගණනයේදී සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

**1.3.4 නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම්**

පහත දැක්වෙන නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 24 වගන්තිය | මාර්ග හා වීථි ලැයිස්තුව රජයේ ගැසට් පත්‍රයේ පලකර නොතිබුණි. |
| **(ආ)** | **1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති** | |
| | (i) පරිච්ඡේදය III - රීති අංක 32 | සභාව විසින් තක්සේරු බදු ලේඛණය පවත්වා නොතිබුණි. |
| | (ii) පරිච්ඡේදය IX - රීති අංක 180 | මුදල් හා ගබඩා කටයුතුවලට සම්බන්ධ වගකිව යුතු නිලධාරීන්ගෙන් ආරක්ෂක ඇප තැන්පතු ලබාගෙන නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | වාහන දෛනික ධාවන සටහන් මාසයේ 15 දිනට පෙර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඈ) | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | |
| | (i) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 චක්‍රලේඛය | වාහනවල ඉන්ධන පරිභෝජනය පරීක්ෂා කර නොතිබුණි. |
| | (ii) 1999 ජුනි 11 දිනැති අංක 14/99 චක්‍රලේඛය | නිලධාරීන් විසින් ලබාගත් සේවක ණය හෙළිදරව් කොට ඇමුණුමක් වශයෙන් දී නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, ඉකුත් වර්ෂය සඳහා වූ රු.1,020,371 ක් වූ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම සමඟ සැසඳූවිට, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.751,422 ක් විය. වියදමේ වැඩිවීම හේතුකොට ගෙන පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.268,949 කින් අඩුවී තිබුණි.

## 2.2 කාරක ප්‍රාග්ධනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, ඉකුත් වර්ෂය සඳහා වූ රු.2,472,690 ක් වූ කාරක ප්‍රාග්ධනය සමඟ සැසඳුවිට සමාලෝචිත වර්ෂය සඳහා වූ කාරක ප්‍රාග්ධනය රු.3,372,923 ක් විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් කාරක ප්‍රාග්ධන රු.900,233 කින් වැඩි වී තිබුණි.

## 2.3 ආදායම් කළමනාකරණය

### 2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

ලේකම් විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු පරිදි, සමාලෝචිත වර්ෂය සඳහා වූ ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම සහ හිඟ ආදායම පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2015 | | 2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | ඇස්තමේන්තුගත | තත්‍ය | |
| | රු'000 | රු'000 | රු'000 |
| වරිපනම් හා බදු | 136 | 88 | 43 |
| බදු කුලී | 763 | 833 | 68 |
| බලපත්‍ර ගාස්තු | 36 | 173 | - |
| වෙනත් ආදායම් | 13,648 | 9,892 | 2,349 |
| | 14,583 | 10,986 | 2,460 |

### 2.3.2 මුද්දර ගාස්තු

ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙතින් ලැබිය යුතු මුද්දර ගාස්තු රු.1,695,540 ක් අයකර ගෙන නොතිබුණි.

### 2.3.3 වෙනත් ආදායම්

බදුකුලී සහ වෙනත් සේවා ගාස්තු වශයෙන් සභාවට හිඟ හිටි රු.647,916 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

සභා ප්‍රදේශය තුල ඝන අපද්‍රව්‍ය කළමනාකරණය විධිමත්ව ක්‍රියාත්මක කර නොතිබුණි.

## 4. වගකීම්භාරය සහ යහපාලනය

## 4.1 අයවැය පාලනය

අවිධිමත් අයවැය පාලනය අයවැය හේතුකොටගෙන අයවැයගත වියදම් හා තත්‍ය වියදම් අතර රු.5,830 සිට රු.2,778,987 දක්වා වූ වෙනස්කම් නිරීක්ෂණය විය.

## 4.2 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන කටයුතු ඵලදායි අන්දමින් මෙහෙයවා නොතිබුණි.

## 4.3 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්

සමාලෝචිත වර්ෂය තුලදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

## 4.4 වත්කම් කළමනාකරණය

**අභාවිත වත්කම්**

2014 වර්ෂය තුලදී රු.885,000 ක පිරිවැයකට ඉදිකරන ලද සතිපොල නිෂ්කාර්යව පැවතුණි.

## 5. පද්ධති හා පාලන

පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) චෙක්පත් නිකුත් කිරීමේ ලේඛණය
(ආ) චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛණය
(ඇ) මුදල් පොත
(ඈ) අත්තිකාරම් ලේඛණය
(ඉ) සේවක ණය ලේඛණය
(ඊ) විවිධ ණයහිමි ලේඛණය
(උ) නිවාඩු ලේඛණය
(ඌ) විගණන විමසුම් ලේඛණය
(එ) වාහන ලොග් පොත්